# වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය

# තේ පර්යේෂණ මණ්ඩලය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

# ඇබෑර්තු

තලවකැලේ, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තාක්ෂණ නිලධාරී (විදුලි)

**රැකියා විස්තරය:**

ආයතනයේ කළමනාකරණ කටයුතු සහ තාක්ෂණික කටයුතු පහසු කිරීම, සහාය වීම සහ අතිරේක සේවා ලබා දීම සඳහා විදුලි ක්ෂේත්‍රයට අදාළ කටයුතු සිදු කිරීම සඳහා වගකීම දැරීම.

**බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්:**

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 05 ට නොඅඩු විදුලි ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්:**

ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**වැටුප් පරිමාණය:** MA 2-2 (2025) රු. 50,540/- 10 X 540 - 7 X 630 - 4 X 1,080 - 20 X 1,280 - රු. 90,270/- (රු. 50,540/- ක මූලික වැටුප 2027.01.01 දින සිට ගෙවනු ලැබේ. 2025.01.01 දිනට ගෙවන ලද මුදල රු. 43,379/- වන අතර නොගෙවූ මුදල රු. 7,161/- කි.)

**වයස:** අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය:** ලිඛිත තරග විභාගයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

මෙම තනතුර ස්ථිර වේ. නියමිත අයදුම්පත්‍රය භාවිත කරමින් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපින සහ දුරකථන අංක ඇතුළත් කර අයදුම්පත් යොමු කළ යුතුය. සියලුම සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පත සමග අමුණා තිබිය යුතුය. අයදුම්පත්‍ර ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ නිල වෙබ් අඩවිය වන **www.tri.lk** වෙතින් බාගත කරගත හැක.

**අනෙකුත් ප්‍රතිලාභ:**

I. නවාතැන් පහසුකම් (සම්පූර්ණයෙන්ම ගෘහ භාණ්ඩ සහිත නිල නිවාස) ,පවතින්නේ නම් ලබා දෙනු ලැබේ; නැතහොත් නිවාස පහසුකම් වෙනුවට දීමනාවක් ගෙවනු ලැබේ.

II. ආයතනයේ වෛද්‍ය යෝජනා ක්‍රමයේ පවත්නා නියමයන් ප්‍රකාරව වෛද්‍ය ප්‍රතිලාභ හිමිවේ.

III. අර්ථසාධක අරමුදල: තෝරාගත් අයදුම්කරු විසින් කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදල සඳහා, තම වැටුපෙන් 10% ක දායකත්වයක් ලබාදිය යුතු අතර ආයතනය ඒ සඳහා 15% ක දායකත්වයක් දරයි. එසේම ආයතනය විසින් සේවක භාරකාර අරමුදලට 3% ක් ද දායක වේ.

IV. තේ පර්යේෂණ ආයතනයේ අදාළ තනතුරට අදාළ අනෙකුත් අතිරේක ප්‍රතිලාභ.

අයදුම්පත අඩංගු කවරයේ ඉහළ වම් පස කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කර **2026 ඔක්තෝබර් 19** දිනට හෝ ඊට පෙර **අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, සාන්ත කූම්බ්ස්, තලවකැලේ** යන ලිපිනයට එවිය යුතුය.

රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින්ගේ අයදුම්පත්, තේරී පත් වුවහොත් සේවයට නිදහස් කළ හැකිද යන්න සහතික කළ යුතු තම ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය. ඉහත අවශ්‍යතාවලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. වැඩිදුර තොරතුරු සඳහා තේ පර්යේෂණ ආයතනයේ **www.tri.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.

**අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී**
**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය**
**සාන්ත කූම්බ්ස්, තලවකැලේ**